# මහ බැංකුවේ ගිණුම් හා කටයුතු

1970 වර්ෂය සඳහා මහ බැංකුවේ මූල්‍ය ගිණුම් II වැනි පරිශිෂ්ඨයේ (19) වැනි සංඛ්‍යා සටහනේ දක්වා ඇත. 1970 දෙසැම්බර් මස අවසානයේදී පැවති තත්ත්වය 1969 වර්ෂය හා සැසඳීමේදී වූ ප්‍රධාන වෙනස්කම් නම්:-

| | වෙනස රුපි. දශ ලක්ෂ |
|---|---|
| මුළු ඉල්ලුම් වගකීම් .. .. | + 65·4 |
| ව්‍යවහාර මුදල් සංසරණය .. .. | — 122·3 |
| ඉල්ලුම් තැන්පතු (එයින් වෙළඳ බැංකුවල + 87·5) .. | + 32·0 |
| පිටරට ණය ගැනීම් .. .. | + 155·6 |
| ජාත්‍යන්තර සංචිතය .. .. | + 28·8 |
| දේශීය වත්කම් (එයින් රජයේ සහතික කළ සුරැකුම්පත් + 126·2) .. | + 154·4 |

\+ වැඩිවීම
— අඩුවීම

වර්ෂය තුළදී රන් පවුම්, ඉන්දියානු රුපියල් සහ එක්සත් ජනපද ඩොලර් සඳහා වූ පහත දැක්වෙන, මහ බැංකු විනිමය අනුපාතිකයන්හි වෙනස්වීම් නොවීය.

| | | විදුලිය පැවරුම් මගින් මිලයට ගැනීම් | විදුලිය පැවරුම් මගින් විකිණීම් |
|---|---|---|---|
| රන් පවුම් (ලංකා රුපියලකට) | තැන් මිල<br>ඉදිරි මිල<br>(සමසක් දක්වා) | සිලිං 1 පැන්ස 4 53/64 මසකට තැන් මිලෙන් පැන්ස 1/12 8 ක් වට්ටම් කොට | සිලිං 1 පැන්ස 4 13/16 මසකට තැන් මිලෙන් පැන්ස 1/128 ක අධිමිලක් ඇතිව |
| ඉන්දියානු රුපියල් (සියයකට) | තැන් මිල<br>ඉදිරි මිල<br>(සමසක් දක්වා) | රුපියල් 79 1/8 මසකට තැන් මිලෙන් රුපියල් 1/32 ක් වට්ටම් කොට | රුපියල් 79 3/16 මසකට තැන් මිලෙන් රුපියල් 1/32 ක් අධිමිලක් ඇතිව |
| එ. ජ. ඩොලර් (සියයකට) | තැන් මිල<br>ඉදිරි මිල<br>(තෙමසක් දක්වා)* | <br>රුපියල් 595.25<br>රුපියල් 595.25 | රුපියල් 595.50 මසකට තැන් මිලෙන් ශත 25 ක අධිමිලක් ඇතිව |

* මහ බැංකුව වෙත විශේෂිත ඉල්ලුම් කිරීමක් වන තෙමසකට වැඩි සහ සමසක් දක්වා.

මහ බැංකුවේ විදේශ විනිමය ගනුදෙනු (II) පරිශිෂ්ඨයේ (24) වැනි සංඛ්‍යා සටහනෙහි දැක්වෙයි.

1970 ජනවාරි 11 දින සිට වාණිජ සහ නිෂ්පාදන ණයවලට සම්බන්ධ, රජයේ සුරැකුම් පත් සහ භාවිතීය පොරොන්දු නෝට්ටු ඇපයට තබාගෙන දෙනු ලබන අත්තිකාරම් සඳහා වන මහ බැංකු පොලී අනුපාතිකය වසරකට සියයට 6½ දක්වා වැඩි කරන ලදි. සහතික මිල ක්‍රමය යටතේ වී මිළයට ගැනීම හා දේශීයව වගා කළ කෘෂිකාර්මික නිශ්පාදිතයන් මිළට ගැනීම, විකිණීම හෝ ගබඩා කර තැබීම සඳහා මුදල් සපයනු වස්, සමුපකාර සමිති වෙත සැපයූ අත්තිකාරම් මුදල් පිළිබඳව වන, භාවිතීය පොරොන්දු නෝට්ටු ඇපයට තබාගෙන මහ බැංකුව විසින් වාණිජ බැංකු වෙත දෙනු ලබන අත්තිකාරම් වෙනුවෙන් අය කෙරෙන පොළී අනුපාතිකය වර්ෂයකට සියයට 3 ක් වශයෙන් නොවෙනස්ව පැවතුණි. වී, රතුළුණු, බොම්බයි ළූණු, මිරිස්, අර්තාපල්, අන්නාසි සහ එළවළු නිෂ්පාදනයට අදළව සමුපකාර සමිති සතුව ඇති භාවිතීය පොරොන්දු නෝට්ටු ඇපයට තබාගෙන, මහ බැංකුව විසින් වාණිජ බැංකු වෙත දෙනු ලබන අත්තිකාරම් සම්බන්ධයෙන් අය කෙරෙන පොළී අනුපාතිකය තවදුරටත්, වර්ෂයකට සියයට 1½ ක් වශයෙන් නොවෙනස්ව පැවතුණි. එහෙත් මෙම අනුපාතිකය භාවිතා වූයේ, මේ පහසුකමෙන් ප්‍රයෝජන ගත්තා වූ වාණිජ බැංකු විසින්, පොරොන්දු නෝට්ටු නිකුත් කළවුන්ගෙන් වර්ෂයකට සියයට 8 කට (නියමිත දිනට ගෙවීම් සිදු කළහොත්

වර්ෂයකට සියයට 3 ක අඩුකිරීමකට අවනත වන සේ) වැඩියෙන් අය නොකළහොත් පමණකි. භාණ්ඩාගාර බිල්පත් සඳහා මහ බැංකුවේ වට්ටම් අනුපාතිකය තවදුරටත්, අවසන් වරට පිළිගත් ටෙන්ඩර් අනුපාතික සාමාන්‍යට වඩා වර්ෂයකට සියයට 1/8 ක්ව පැවතුණි.

**විදේශීය මුදල් නෝට්ටු**

නියම කරන ලද අනුපාත යටතේ, ලංකාවේ ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යනු ලබන වාණිජ බැංකුවලින්, විශේෂිත විදේශීය මුදල් නෝට්ටු මිලදී ගැනීම මහ බැංකුව විසින් තවදුරටත් පවත්වාගෙන යන ලදී.

**ණය සහතික ක්‍රමය**

මෙම ක්‍රමය යටතේ, වී, රතුළූණු, බොම්බයි ළූණු, මිරිස්, අර්තාපල්, අන්නාසි සහ එළවළු වගා කිරීම සඳහා වාණිජ බැංකු විසින් සමුපකාර සමිති වෙත දෙනු ලැබූ ණය මුදල් වලින්, ගෙවීම පැහැර හැරෙන ප්‍රමාණයෙන්, සියයට 75 දක්වා ගෙවීම අඩ්ඩුව වෙනුවෙන් මහ බැංකුව සහතික කරයි. සහතික කිරීමේ ගාස්තුවක් වශයෙන් සියයට එකකින් අඩක් වාණිජ බැංකු විසින් ගෙවිය යුතුය. 1970 දී, වාණිජ බැංකු විසින් දී ඇති රුපියල් 50,695,000 ක ණය මුදල් ප්‍රමාණයක් මහ බැංකුව විසින් සහතික කරන ලදී.

**මධ්‍යම හා දිගුකාලීන ණය**

වසර තුළදී රුපියල් 22,252,000 ප්‍රති මූල්‍ය ණය, ණය දෙන ආයතන වලට දෙන ලදී. මහ බැංකුව විසින්, ණය දෙන ආයතන වලට දෙනු ලැබූ ප්‍රතිමූල්‍ය ණය සඳහා පොළී අනුපාතිකයන් 1970 ජනවාරි 11 වැනි දින සිට පහත දැක්වෙන අයුරින් සංශෝධනය කරන ලදී:-

(අ) කෘෂිකර්මය හෝ කර්මාන්ත නගාලීම හෝ සංවර්ධනය සඳහා - වසරකට සියයට $6\frac{1}{2}$ කි.

(ආ) තේ පාලක තැන පොළියෙන් කොටසක් ගෙවන, තේ කර්මාන්තශාලා නවීකරණයට සහ අළුතෙන් ඉදි කිරීම සඳහා වන ණය මුදල්වල;

- (i) දේශීය වියදම් පියවා ගැනීම සඳහා වන ප්‍රතිමූල්‍ය ණය වෙනුවෙන් වසරකට සියයට 5 කි.
- (ii) විදේශ විනිමය වියදම පියවා ගැනීමට සඳහා වන ප්‍රතිමූල්‍ය ණය වෙනුවෙන් වසරකට සියයට 7 කි.

(ඇ) වෙළඳ, වාණිජ හෝ ව්‍යාපාර නගාලීම හෝ සංවර්ධනය සඳහා - වසරකට සියයට $7\frac{1}{2}$ කි.

**මුදල් නිකුතුව**

1970 අවසානයේදී, සංසරණය වූ මුළු මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1,090.4 ක් වූ අතර, එය 1969 අවසානයේ සංඛ්‍යාව හා සසඳන කල රුපියල් දශ ලක්ෂ 122.3 ක අඩුවීමකි. සංසරණයේ පැවති නෝට්ටුවල රුපියල් දශ ලක්ෂ 128.0 ක අඩුවීමක් සහ සංසරණයේ පැවති කාසිවල රුපියල් දශ ලක්ෂ 5.7 ක වැඩිවීමක් විය.

70-10-26 වැනි දිනට පෙර දතමක් දරන සියළුම, රුපියල් 100/- සහ රුපියල් 50/- වටිනාකමක් දරන මුදල් නෝට්ටු 70-10-25 වැනි දින යළි නිකුත් කළ අතර, එය 70-11-3 සිට නීත්‍යානුකූල භාවිතයෙන් තොර විය. පැරණි රටාවෙන් යුතු වූ අවලංගු කළ මුදල් නෝට්ටු වෙනුවට, රුපියල් 100/- සහ රුපියල් 50/- අළුත් මුදල් නෝට්ටු 70-10-26 වැනි දින නිකුත් කරන ලදී. මෙම මුදල් නෝට්ටු මුළුමනින්ම නව රටාවකින් යුක්ත ඒවා වේ. නෝට්ටු දෙකේම ඉදිරිපස වූ මහා පරාක්‍රමබාහු රජ තුමාගේ පිළිරුවේ ප්‍රතිනිර්මානය, දිවංගත එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක අගමැති තුමාගේ සම රූපයක් මගින් ප්‍රතිස්ථාපනය කොට ඇත. රුපියල් 100/- නෝට්ටුවේ පිටුපස පැවති සීගිරි බිතුසිතුවම, බෙර කරුවකුගේ සහ උඩරට නැට්ටුක් කරුවන් තිදෙනෙකුගේ රූපයක් මගින් සහ රුපියල් 50 හේ නෝට්ටුවේ සඳකඩ පහන සහ පියගැට පෙළේ ප්‍රතිනිර්මානය විහාර මහා දේවිගේ සිහිවටනයකින් ද ප්‍රතිස්ථාපිත කර ඇත.

**විදේශ විනිමය හිමිකම් සහතික පත්‍ර ක්‍රමය.**

ශ්‍රී ලංකා, මහ බැංකුව, ලංකාණ්ඩුව වෙනුවෙන් විදේශ විනිමය හිමිකම් සහතික පත්‍ර ක්‍රමය පාලනය කිරීම තව දුරටත් කරගෙන යන ලදී.

**ආසියානු සංවර්ධන බැංකුව - දෙවන ණය මුදල**

රජයේ තේ කර්මාන්තශාලා නවීකරණ යෝජනා ක්‍රමයේ විදේශ විනිමය වියදම ආවරණය කර ගැනීම යදහා 1970 දෙසැම්බර් මස 1 වැනි දින මහ බැංකුව එ. ජ. ඩොලර් දශ ලක්ෂ 3.5 ක ණයක් සඳහා ගිවිසුමකට ඇතුලත් විය.

**ආදායම සහ වියදම**

වර්ෂය සඳහා මහ බැංකුවේ ආදායම රුපියල් 80,984,000/- ක් වූ අතර, සංචිත සඳහා වෙන් කිරීම් සහ ගොඩනැගිල්ලේ වටිනාකම් ක්ෂය වීම සඳහා වූ ප්‍රතිපාදනය ද ඇතුළත්ව වියදම රුපියල් 79,914,030 ක් විය. මුදල් නීති පත්‍රයේ 39 (ආ) වගන්තියට අනුව ශුද්ධ ලාභය වූ රුපියල් 1,000,000 අතිරික්තයට එකතු කරන ලදී.

**බැංකු පරිපාලණය**

මුදල් නීති පනතේ 29 (i) වැනි වගන්තිය යටතේ බැංකු පරිපාලන දෙපාර්තමේන්තුව, 1970 වර්ෂයේදී වාණිජ බැංකු පහක් පරික්ෂා කළ අතර, කලින් පටන් ගන්නා ලද තවත් බැංකු පහක පරීක්ෂණ කටයුතු අවසන් කරන ලදී. 1967 අංක 36 දරන පනතින් සංශෝධනය කළ පරිදි, 1961 අංක 65 දරන මුදල් පනතේ iii වන කොටසෙහි ක්‍රියාවලිය හා සම්බන්ධ කාර්‍යයන් දෙපාර්තමේන්තුව විසින් තවදුරටත් පවත්වාගෙ යන ලදී. සංවර්ධන මූල්‍ය අංශය ආසියානු සංවර්ධන බැංකුව විසින් තේ කර්මාන්තශාලා නවකරණ යෝජනා ක්‍රම සඳහා මහ බැංකුව වෙත ලබාදෙන ලද පළමු හා දෙවන ණය මුදල් මංලාවන් මහ බැංකුව විසින් ප්‍රතිමූලය කිරීමට පෙර අගයීමෙහි තවදුරටත් නිරත විය. මහ බැංකුවේ මැදි හා දිගුකාලීන ණය අරමුදලෙන්. කර්මාන්ත, කෘෂිකර්මාන්ත සහ වාණිජ කටයුතු සඳහා දෙන ලද අනිකුත් ප්‍රතිමූල්‍ය ණය මුදල් ද අංශය මගින් අයැයිය.